# සංස්කෘතික පසුබිම




ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන මහනුවර ප්‍රදේශය, අනුරාධපුර, පොළොන්නරු යුගයන් හි දී මලය රටට අයත් ව තිබුණි. ජනප්‍රවාදයනට අනුව, ගම්පොළ රජකම් කළ තෙවන වික්‍රමබාහු රජතුමා විසින් මෙම නගරය මැනවින් ගොඩනගනු ලැබ ඇත. පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ රාජ්‍ය සමයෙහි මෙම ප්‍රදේශය සෙංකඩගල ලෙසින් හැඳින් වූ අතර එතුමා විසින් මෙහි විසිතුරු දළදා මාළිගය හා රජ මාළිගය නිර්මාණය කරවා මෙම නගරය සිංහල රාජධානියේ අගනගරය බවට පත්කලේය. එතැන් සිට ශතවර්ෂ තුනකට අධික කාලයක් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි රුදුරු ආක්‍රමණයන්ගෙන් බෞද්ධාගම හා සිංහල සංස්කෘතිය රැකගනිමින් 1815 මාර්තු 02 දින දක්වා සෙංකඩගල, සිංහල රාජධානියේ අගනගරය විය.

යුරෝපීයයන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන සමයෙහි, ඔවුනට එරෙහිව ජයග්‍රාහී සටන් රැසක් මහනුවර ආසන්නයේ සිදුවිය. පළමුවෙනි විමලධර්මසූරිය හා දෙවන රාජසිංහ රාජ්‍ය සමයන්හි ගන්නෝරුව හා දන්තුරේ සටන් වලින් විදේශ ආක්‍රමණිකක හමුදා සමූල ඝාතනය විය. විදේශ ආක්‍රමණයන්ගෙන් ආරක්ෂා වීම පිණිස ගොඩනගන ලද බලකොටු අතරින් බලන බලකොටුව අදටත් කඩුගන්නාව නගරය ආසන්නයේ පිහිටා ඇත.

එහෙත් විවිධ පාර්ශවයන් අතරෙහි ඇති වූ අර්බුද හේතුවෙන් 1815 දී මහනුවර රාජධානිය ඉංග්‍රීසීන් විසින් යටත් කරගනු ලැබූ අතර සිංහලේ අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා, මැදමහනුවර බෝමුරේ දී 1815 පෙබරවාරි 15 දින අත්අඩංගුවට ගන්නා ලදී. මහනුවර මගුල් මඩුවේ දී 1815 මාර්තු 2 දින, උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඉංග්‍රීසින් විසින් ශ්‍රී ලංකාවේ පාලනය භාරගන්නා ලද අතර ඔවුන් විසින් කොළඹ අගනගරය ලෙස ප්‍රකාශයට පත්කරන තෙක් මහනුවර අගනගරය ලෙස පිළිගන්නා ලදී.

මහනුවර ප්‍රදේශයේ උඩරට රදල නායකයෝ රැසක්, සිංහලේ අවසන් නිදහස් සටන වූ 1818 ඌව වෙල්ලස්ස සටන මෙහෙය වූහ. මෙම උඩරට රදල නායකයින් අතරින් ,ස්වකීය තනතුරු, නම්බුනාම ආදිය අතහැර දමා පැමිණි මොනරවිල කැප්පෙටිපොල, මඩුගල්ල වැනි නායකයන් බහුතරයකගේ ජන්ම භූමිය වූයේ මෙම ඓතිහාසික මහනුවර භූමියයි. 1818 කැරැල්ල කෲරලෙස මැඩ පැවැත්වීමෙන් අනතුරුව බ්‍රිතාන්‍යයෝ, මහනුවර ඇතුළු උඩරට ප්‍රදේශය වැවිලි කර්මාන්තය හා වෙළදාම පාදක කරගත් ආර්ථිකයක් කරා මෙහෙයවූහ. වැවිලි කර්මාන්තය යටතේ පළමුවෙන් හඳුන්වා දුන් කෝපි වගාව දිලීර රෝගයකින් විනාශ වීමෙන් අනතුරුව හඳුන්වා දුන් තේ වගාව යටතේ ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ පැලකරන ලද මුල් ම තේ ගස, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලූල්කඳුර වතුයායේ අද ද දක්නට ඇත.

සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ බඳු වූ ශ්‍රී දළදා මාළිගාව පිහිටියේ ද මෙම අති පූජනීය මහනුවර නගරයෙහිය. ලොව පුරා සුපතල, ශ්‍රී ලංකාවේ සංස්කෘතික අංගය වන මහනුවර දළදා පෙරහැර පැරණි හෙල සිරිත් රකිමින් වාර්ෂික ව සංවිධානය කෙරේ.

# Cultural Background



During the Anuradhapura, Polonnaruwa reigns, a proud history related Kandy expanse had belonged to the Malayarata. According to the Folktales, this city had been well developed by the king wickramabahu III who ruled in Gampola. In the period of king Wimaladarmasooriya (I), Kandy had been introduced as Senkadagala and he developed this city as the Capital of the Sinhala kingdom with creating beautiful Dalada Maligawa and palace. Onwards 3 Centuries, by protecting Buddhisum and Sinhalese culture from various furious invasions of Portuguese, Dutch and British; Senkadagala was the capital of Sinhala kingdom up to 1815 march 2nd.

When Europeans ruling the Coastal areas, there were several victorious battles have occurred near by Kandy, against them. The Period of king Wimaladhamasooriya (I) and king Rajasinghe (II), in the battles of Gannuruwa and Danture , foreign soldiers had been completely destroyed. One of a main fortresses Balana which was built to protect Sinhala kingdom from foreign invasions, at present locates near Kadugannawa.

Nevertheless, due to the many partisan disputes, Kandy Kingdom was conquered by the British in 1815 and they arrested the last Sinhala king Sri Wickrama Rajasinghe at Bomure in Medamahanuwara on 15th Feburary 1815. After signing the Upcountry Agreement in the Kandy " Magulmaduwa" on March 2nd 1815, British has taken the ruling of Sri lanka and they accepted kandy as the Capital until they announced Colombo as the Capital.

There were so many upcountry noble leaders in kandy region have led the Sinhalese last historical combat for the Independence , "Uva Wellassa" combat in 1818. Majority of those noble leaders, such as Monarawila Keppitipola, Madugalla who left their respected designations were born in this historic Kandy land. After cruelly ceased the 1818 battle, hill country including Kandy was directed the Plantation and trade based economy by British. Under the plantation industry, firstly introduced coffee was destroyed by the fungus disease and their next replacement was Tea and the first Tea plant which was planted in Sri- Lanka is in Loolkandundura estate in Delthota D.S Division and it can be seen even at present.

The most honorable place of the Buddhists in all over the world, Temple of Tooth (Dalada Maligawa) is situated in this sacred Kandy city. The world famous Cultural event in Sri-Lanka "Dalada Perehera" is being organized annually with performing ancient Sinhalaese traditions.